" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI SYSTEM CERTIFIED ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/06 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.06. 20 |
|---|---|---|---|---|---|

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පාලන චක්‍රලේඛ අංක 02/2023

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්.

**<u>විනය දඬුවම් වශයෙන් වැටුප් වර්ධක විලම්භනය කිරීම.</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2015 ට සමගාමීව මෙම පාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. විනය දඬුවමක් වශයෙන් වැටුප් වර්ධක විලම්භනය කිරීමේදී එම දඬුවම ක්‍රියාත්මක කල යුතු වන නිශ්චිත දිනය පිළිබඳව තීරණය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 23:9 උප වගන්තිය/ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටි රීති සංග්‍රහයේ 30(8) උප වගන්තිය අනුව විනය දඬුවමක් පැන වූ විට එය බලාත්මක විය යුත්තේ චූදිත නිලධාරියා අදාළ වරද සිදු කළ දින සිට ක්‍රියාත්මක වන පරිදිය.

04. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 14:12 උප වගන්තිය/ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටි රීති සංග්‍රහයේ 21(12) උප වගන්තිය අනුව, වැටුප් වර්ධක ගෙවීම අත්හිටවනු ලබන්නේ චෝදනා පත්‍රයක් නිකුත් කළ පසුව බැවින් වරද කළ දිනයේ සිට චෝදනා පත්‍රය නිකුත් කරනු ලබන දිනය දක්වා කාලය තුළ යම් නිලධාරියකු වැටුප් වර්ධක උපයා ගනු ඇත.

05. යම් නිලධාරියෙකු වරද සිදු කළ දින සිට එසේ වැටුප් වර්ධකය උපයා ගෙන ඇතත්, පනවා ඇති විනය දඬුවම වැටුප් වර්ධක විලම්භනය කිරීමක් නම්, එවැනි අවස්ථාවකදී දඬුවම ක්‍රියාත්මක කිරීම ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 23:9 උප වගන්තිය/ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටි රීති සංග්‍රහයේ 30(8) උප වගන්තිය ප්‍රකාරව සිදු කළ යුතු බව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2013 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 24:6 උප වගන්තිය/ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටි රීති සංග්‍රහයේ 31(5) උප වගන්තිය මගින් මගින් දක්වා ඇත.

06. ඒ අනුව ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 23:9 උප වගන්තියේ/ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටි රීති සංග්‍රහයේ 30(8) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර, චූදිත නිලධරයා වරද කළ දින සිටම විනය දඬුවම ක්‍රියාත්මක කල යුතුය. යම් හෙයකින් චූදිත නිලධරයා වරද කළ දින සිට චෝදනා පත්‍රය නිකුත් කරනු ලබන දිනය දක්වා කාලය තුළ ඔහුට වැටුප් වර්ධක ලබා දී තිබුණේ නම්, ඔහුට දඬුවම් පැමිණවීම පිණිස විලම්භනය කරනු ලබන වැටුප් වර්ධක සංඛ්‍යාව ඔහු වරද කළ දින සිට ගණනය කර ඔහුගේ වැටුප සංශෝධනය කළ යුතුය.

07. විනය නියෝගයේ සඳහන් වැටුප් වර්ධක ගණන විලම්භනය කළ පසුව එළැඹෙන දින සිට සතුටුදායක සේවා කාලය ගණනය කල යුතු අතර, එය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති 172 හී විධිවිධාන වලට යටත් ව ගණනය කල යුතු වනු ඇත.

08. තවද, විනය නියෝගයේ කොටසක් වශයෙන් වැඩ තහනම් කර තිබූ කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් නොගෙවීමට නියෝග කර ඇති අවස්ථාවකදී නිලධාරියාගේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 24:7 උප වගන්තියෙහි/ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටි රීති සංග්‍රහයේ 31(6) උප වගන්ති වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කල යුතුය.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.